# 2018

ඩිජිටල් යටිතල පහසුකම්
හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள்
மற்றும் தகவல் தொழிநுட்ப அமைச்சு

MINISTRY OF DIGITAL INFRASTRUCTURE
AND INFORMATION TECHNOLOGY





ICTA
ideas actioned

SRI LANKA CERT|CC

කාර්යය සාධන වාර්තාව
வருடாந்த செயல்திறன் அறிக்கை
Performance Report
2018.12.31

# පටුන

## ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

### පරිච්ඡේදය 01 - අමාත්‍යාංශ පසුබිම


1.1 අමාත්‍යාංශ විකාශනය ....................................................04

1.2 දැක්ම සහ මෙහෙවර ....................................................05

1.3 ඩිජිටල් යටිතල පහසුකම් අංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන....................06

1.4 සුවිශේෂ කාර්යයන් හා කර්තව්‍යයන් ....................................07

1.5 කාර්ය මණ්ඩල තොරතුරු ....................................................08


### පරිච්ඡේදය 02 - මෙම අමාත්‍යාංශය විසින් සෘජුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති


2.1 අමාත්‍යාංශය විසින් සෘජුව ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ....................10


### පරිච්ඡේදය 03 - මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති


3.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති....................................................15

3.2 ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ..........27


### පරිච්ඡේදය 04 - අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය


4.1 2018 වර්ෂයේ අය වැය ඇස්තමේන්තු යටතේ වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන හා වියදම් ...31

4.2 අමාත්‍ය කාර්යාලය ....................................................33

4.3 පරිපාලන හා ආයතනික සේවා....................................................35

4.4 තොරතුරු තාක්ෂණ සංවර්ධන ....................................................37

# පරිච්ඡේදය 01

## අමාත්‍යාංශ පසුබිම

**අමාත්‍යාංශයේ විකාශනය**



**ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය**

## දැක්ම

**" ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල වූ දැයක් "**

## මෙහෙවර

**මානව හා ජාතික සංවර්ධනය තහවුරු කිරීම සඳහා;**

- පුරවැසියන්ගේ ඩිජිටල් සාක්ෂරතාවය ඉහළ නැංවීම
- ඩිජිටල් සේවාවන් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම
- ඩිජිටල් සේවා හා ඩිජිටල් නිෂ්පාදන සුලභ කිරීම
- ඩිජිටල් තාක්ෂණික කර්මාන්ත හා ඩිජිටල් තාක්ෂණික ආර්ථික වැඩි දියුණු කිරීම

## ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

### 2018.12.28 දිනැති අංක 2103/34 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව



## ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ

## කාර්යයන් හා කර්තව්‍යයන්

### 2018.12.28 දිනැති අංක 2103/34 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව

- ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ විෂයට සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ ඊට අනුබද්ධිත ආයතන, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය සහ සියළුම තොරතුරු තාක්ෂණ උද්‍යාන යන ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

- නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට ඩිජිටල් යටිතල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- අන්තර් රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය තුළින් රජයේ සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හිත් අනෙකුත් රාජ්‍ය ව්‍යවස්ථායන්හිත් සේවා සැපයීමේ ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ඩිජිටල් පරිණාමන මූලාරම්භන සඳහා පහසුකම් සැපයීම හා අධීක්ෂණය.

- ඩිජිටල් සාක්ෂරතාවය ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- සමාජයේ සියළුම ස්ථරවල තොරතුරු තාක්ෂණය භාවිතය ධෛර්යමත් කිරීම හා ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සංවර්ධනය සහ පුද්ගලික අංශය සමග හවුල් වී ඩිජිටල් ආර්ථික මූලාරම්භයන් සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.

- තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලසීම.

- සයිබර් ආරක්ෂණයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සක්‍රියව මැදිහත්වීම හා එවැනි සිද්ධීන් වැලැක්වීම පිණිස වූ ජාතික මධ්‍යස්ථානය පිළිබඳ කටයුතු හා එමගින් අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ අයතනවලට ඩිජිටල් ව්‍යවහාරික පරීක්ෂණ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහාය ලබාදීම.

- ඩිජිටල් යටිතල පහසුකම්වල ආරක්ෂාව පිළිබඳ විගණන හා සයිබර් ආරක්ෂණ සේවා කළමනාකරණ කටයුතු.

- ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනයේ දී, ජාත්‍යන්තර සහයෝගීතාවය, සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ ඊට අනුබද්ධිත ආයතන, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය, සියළුම තොරතුරු තාක්ෂණ උද්‍යාන යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ ඊට අනුබද්ධිත ආයතන, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය, සියලුම තොරතුරු තාක්ෂණ උද්‍යාන යන අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන් අධීක්ෂණය කිරීම.

## අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්

1. 2003 අංක 27 දරණ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත
2. 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත
3. අමාත්‍යාංශයේ කාර්ය පථයට අයත් සම්බන්ධ වෙනත් නීති

**ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය**

| | තනතුර | සේවය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ලේකම් | | 01 | 0 | - |
| 02 | අතිරේක ලේකම් | ශ්‍රී ලං.ප.සේවය(විශේෂ) | 02 | 02 | - |
| 03 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලං.ප.සේවය 1 | 01 | 01 | - |
| 04 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේවය 1 | 01 | 01 | - |
| 05 | අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී ලං.ප.සේවය 1/ ශ්‍රී.ලං.ඉ.සේ.1<br>ශ්‍රී ලං.තො.ස.තා.සේවය 1 පන්තියේ 1 ශ්‍රේණිය | 01 | 0 | 01 |
| 06 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේවය 1 | 01 | 01 | - |
| 07 | අධ්‍යක්ෂ | ශ්‍රී ලං.ප.සේවය 1 | 01 | - | 01 |
| 08 | සහකාර ලේකම් | ශ්‍රී ලං.ප.සේවය 111/11 | 01 | 01 | 0 |
| 09 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී ලං.ප.සේවය 111/11 | 03 | 02 | 01 |
| 10 | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං.ක්‍ර.සේවය 111/11 | 01 | 01 | - |
| 11 | ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේවය 111/11 | 01 | 01 | - |
| 12 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේවය(අධි ශ්‍රේණිය) | 01 | - | 01 |
| 13 | භාෂා පරිවර්තක | රජයේ භාෂා ප.සේවය 11/1 | 02 | - | 02 |
| 14 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී ලං.තො.ස.තා.සේවය 02 පන්තියේ 11/1 ශ්‍රේණි | 01 | 01 | -- |
| 15 | සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරි සේවය 111/11/1 | 15 | 07 | 08 |
| 16 | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | 01 | 0 | 01 |
| 17 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේවය 111/11/1 | 30 | 24 | 06 |
| 18 | වීඩියෝ කැමරා ශිල්පී | තාවකාලික | 01 | - | 01 |
| 19 | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය 111/11/1/විශේෂ | 13 | 10 | 03 |
| 20 | වීඩියෝ කැමරා සහායක | තාවකාලික | 01 | - | 01 |
| 21 | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේවය 111/11/1/විශේෂ | 12 | 09 | 03 |
| | **එකතුව** | | **91** | **61** | **30** |

# පරිච්ඡේදය - 02

**ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය මගින් සෘජුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති**

| ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය<br>2018 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති (2018.12.31 දක්වා) | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
| යොමු අංකය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මිලියන) | වැය කළ මුදල (රු.මිලියන) | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| 1 | ඩිජිටල් සාක්ෂරතාවය, ඉ-රාජ්‍ය සහ තොරතුරු තාක්ෂණ සම්පත් ධාරිතාව පිළිබඳව සොයා බැලීම් හා සමීක්ෂණ කිරීමේ ව්‍යාපෘතිය | 5.00 | 0.24 | 47.0% | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය(SLIDA) සමග එකතු වී සමීක්ෂණ වාර්තා 19ක් තෝරා ගෙන ඇති අතර, එම වාර්තා ඇගයීමට නියමිතය. |
| 2 | මූලික පරිගණක දෘඩාංග භාවිතයෙන් අන්තර්ජාල කටයුතු පිළිබඳව (IoT) දැනුවත් කිරීම තුළින් පරිගණක වැඩසටහන් සඳහා පාසල් සිසුන් යොමු කරවීමේ ව්‍යාපෘතිය | 109.25 | 81.92 | 94.0% | • මෙම ව්‍යාපෘතිය මගින් සිසුන්ගේ තර්ක විශ්ලේෂණ හැකියාව තාක්ෂණ ක්‍රමවේද භාවිතයෙන් දියුණු කෙරේ.<br>• දෘඩාංග ලබා දීම සිදු කර ඇත. IoT කට්ටල 1930 ද, විදුලි ට්‍රොලි හා මයික්‍රෝ බිට්/සංවේදක 7,720ක් ලබා දී ඇත.<br>• මෘදුකාංග පිළිබඳ සහ ගුරුවරුන් පුහුණු කර ඇත.<br>• ගුරුවරු 568 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 8ක් පවත්වා ඇත. |
| 3 | ඉ- ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය (මහජනතාවට වඩාත් සමීප නිලධාරියා වන ග්‍රාම නිලධාරීන්ගේ තොරතුරු තාක්ෂණ භාවිතය වැඩිදියුණු කිරීම) | 467.85 | 21.23 | 58.0% | <u>1 අදියර</u><br>• කොළඹ, ගාල්ල, කුරුණෑගල, බදුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. මෘදුකාංගයන් හඳුන්වා දීම, පරිගණක පහසුකම් සැපයීම, ගෘහමූලික දත්ත රැස්කොට මෘදුකාංගයට ඇතුළත් කර දීම, අන්තර්ජාල පහසුකම් ලබා දීම සඳහා දත්ත පැකේජයක් ලබා දීම, මූලික පරිගණක පුහුණුවක්, දෘඩාංග හා මෘදුකාංග පුහුණුවක් ලබා දීම සිදු කරන ලදී.<br><u>අදියර 11</u><br>• මෙම ව්‍යාපෘතිය සඳහා පරිගණක මෘදුකාංග සංවර්ධන කටයුතු සිදුකෙරෙමින් පවතී.<br>• ගෘහ මූලික දත්ත පත්‍රිකා මුද්‍රණය කිරීමේ කටයුතු රාජ්‍ය මුද්‍රණාලය සමග සම්බන්ධ වී සිදු කිරීමට නියමිතය.<br>• දත්ත වර්ගීකරණය (Data Classification) කටයුතු සිදුවෙමින් පවතී.<br>• ග්‍රාම නිලධාරීන් 3.500ක් සඳහා මූලික පරිගණක පුහුණුවීම් දිස්ත්‍රික් මට්ටමින් පවත්වා ඇත. ඒ සඳහා දිස්ත්‍රික්ක 25කට ප්‍රතිපාදන නිදහස් කර ඇත.<br>• දෘඩාංග ප්‍රසම්පාදනය අවසන් අදියරේ පවතී. |

| ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය<br>2018 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති (2018.12.31 දක්වා) | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
| යොමු අංකය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මිලියන) | වැය කළ මුදල (රු.මිලියන) | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| **4** | පාසල් පරිගණක විද්‍යාගාර ව්‍යාපෘතිය (සිසුන්ගේ හා ගුරුවරුන්ගේ ඩිජිටල් සාක්ෂරතාව වැඩිදියුණු කිරීම) | 250.00 | 138.85 | 58.0% | • මෙම ව්‍යාපෘතිය යටතේ පාසල් පරිගණක විද්‍යාගාර 55ක් සඳහා උපකරණ සැපයීමට ලංසු කැඳවා අවසන් කර ඇති අතර, ඇගයීම් සිදු කරමින් පවතී.<br>• ගුරුවරු පුහුණු කිරීම ආරම්භ කර ඇත.<br>• පාසල් පරිගණක විද්‍යාගාරවල යටිතල සංවර්ධන පහසුකම් සංවර්ධනය කර ඇත. |
| 5 | ජ්‍යොෂ්ඨ පුරවැසියන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 4.00 | - | 38.0% | මෙම නියමු ව්‍යාපෘතිය ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, විෂය නිර්දේශය සකස් කර ඇත. |
| 6 | අන්තර්ජාලය භාවිතය ප්‍රවර්ධනය කිරීම හා ශ්‍රී ලාංකික සමාජයේ ඩිජිටල්කරණය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | 65.68 | 15.38 | 78.0% | • මෙම ව්‍යාපෘතිය මගින් සාමාන්‍ය ජනතාව ඩිජිටල්කරණය පිළිබඳව දැනුවත් කිරීම සඳහා රූපවාහිනි වැඩසටහන් නිර්මාණය කිරීම පිළිබඳව ප්‍රසම්පාදන කටයුතු අවසන් අදියරේ පවතී.<br>• මෙම වර්ෂය තුළ CXO Forum වැඩසටහනක් පවත්වා ඇත. Sri Lanka Broadband Forum සඳහා වැය දැරීමට යෝජනා වී ඇත.<br>• 2018 සැප්තැම්බර් මස IDUAI වැඩසටහන පවත්වන ලදී.<br>• INFOTEL 2018 වැඩසටහන පවත්වන ලදී. |
| 7 | කෘෂිකාර්මික ප්‍රජාව තුළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය පුළුල් කිරීම | 30.00 | 13.01 | 83.0% | • L3F සංසදය සමඟ එක්ව් ගොවි ජනතාවගේ කෘෂිකාර්මික කටයුතු වලදී ඇති වන ගැටළු විසඳීමට හා ඵලදායීතාවයෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමටත් මෙන්ම ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහාත් නවීන තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කරන ආකාරය පිළිබඳව Video දර්ශන මගින් මෙන්ම සාකච්ඡා මාර්ගයෙන් ද ප්‍රායෝගිකව ද ගොවි ප්‍රජාව දැනුවත් කිරීම (ත්‍රෛභාෂා මාධ්‍යයෙන්) මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරයි.<br>• පරිගණක මෘදුකාංග ආශ්‍රිත පණිවිඩ සේවාවන් සංවර්ධනය කිරීමට සුදුසු තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර ඇති අතර, අදාළ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් දක්ෂතා ඇති කෘෂි නිලධාරීන් 56ක් පුහුණු කර අවසන් කර ඇත. |

| ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය<br>2018 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති (2018.12.31 දක්වා) | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
| යොමු අංකය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මිලියන) | වැය කළ මුදල (රු.මිලියන) | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| | | | | | • මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී පරිගණකයක්, UPS, Speaker සහ headset, Screen ලබා දෙනු ලැබේ.දැනට මෙම උපකරණ 55ක් ලබා දී ඇත. |
| 8 | රාජ්‍ය අංශයේ මාණ්ඩලික නිලධාරීන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතාවය වර්ධනය කිරීම | 43.00 | 4.13 | 71.0% | මෙම ව්‍යාපෘතිය මගින් තොරතුරු තාක්ෂණ විෂය පිළිබඳ රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.<br>• මෙම ව්‍යාපෘතිය මගින් පරිපාලන ක්ෂේත්‍රයේ, ගණකාධිකාරී සහ සැලසුම් ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු නිලධාරීන් සඳහා පුහුණුවීම් සිදු කරනු ලබයි.<br>• මෙහිදී Project Management, Cybersecurity සහ Digital Government යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණුවක් කොළඹ දිස්ත්‍රික්කය තුළ වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් සාර්ථක ලෙස නිම කර ඇත.<br>• රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ විෂය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා පසුගිය වසරේ විභාගයක් පවත්වා ලකුණු 50ට අඩුවෙන් ලබාගත් නිලධාරීන්ට පසුගිය වසරේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා එක්ව පුහුණුවක් ලබා දෙන ලදී.<br>• Web Development, System Administration සහ Network Administration පිළිබඳ පුහුණුවක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන්ට ලබා දීම සඳහා අවශ්‍ය විෂය මාළාව කොළඹ විශ්ව විද්‍යාල පරිගණක අධ්‍යාපන ආයතනය (UCSC) මගින් සකසන ලදී.<br>• වෛද්‍ය පරිපාලනයේ නිලධාරීන් 50 දෙනෙකු සඳහා MOS පුහුණුව ලබා දෙන ලදී. |
| 9 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා ඒ ආශ්‍රිත තොරතුරු තාක්ෂණ නිපුණතාවයන් වර්ධනය කිරීම | 200.60 | 199.46 | 97.0% | • මෙම ව්‍යාපෘතිය මගින් පරිගණක පහසුකම් අඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට පරිගණක පහසුකම් ලබා දෙනු ලැබේ.<br>• දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා පරිගණක 1250ක් UPS 250ක් සහ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණය යන්ත්‍ර 250 ක් බෙදා දී ඇත.<br>• දෘඩාංග පුහුණුව ලබාදීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. |

| ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය<br>2018 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති (2018.12.31 දක්වා) | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
| යොමු අංකය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මිලියන) | වැය කළ මුදල (රු.මිලියන) | සමුච්චිත භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| 10 | රාජ්‍ය අංශයේ සංවිධානයන් සඳහා තොරතුරු තාක්ෂණ මාදුකාංගයන් සංවර්ධනය හා වැඩි දියුණු කිරීම | 45.97 | 13.98 | 56.3% | • ඉ-රාජ්‍ය ප්‍රත්පත්තිය රාජ්‍ය ආයතනවල සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. ඒ අනුව රාජ්‍ය ආයතන 04ක ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නිකුත් කර අවසන් කර ඇත. |
| 11 | රාජ්‍ය ආයතන සඳහා ආදර්ශ ඉ-කාර්යාල රාමු සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | 22.00 | 1.62 | 44.0% | • ඉන්දියාවේ NIC ආයතනය මගින් සංවර්ධනය කරන ලද මෘදුකාංගයක් මගින් අප අමාත්‍යාංශයේ විදේශ නිවාඩු ඉල්ලුම්පත් අනුමත කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබේ.<br>මෙම ව්‍යාපෘතියේ කටයුතු සාර්ථක කිරීම සඳහා කොරියානු රජයේ උපදේශකයකුගේ (KOICA ආයතනයේ) සහාය ලබා දී තිබේ. |
| 12 | OGP විවෘත රාජ්‍ය සහයෝගීතා ජාතික සැලැස්ම සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රත්‍යන්ත ක්‍රම ශක්තිය ලබා දීමේ ව්‍යාපෘතිය | 19.00 | 0.43 | 24.0% | • මෙම ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ කටයුතු සඳහා කෘත්‍රිම බුද්ධිය(AI) භාවිතා වන 1919 Chatbot නිර්මාණය සඳහා රාජ්‍ය ආයතන 25ක තොරතුරු ඇතුළත් කොන්ත්‍රාත්තුව අත්සන් කර ඇත.<br>• ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ලිපිලේඛන රාජ්‍ය ආයතන 12ක ලබා ගෙන ඇත.<br>• රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ(GIC-1919) අතිරේක වැඩි දියුණු කිරීම් සඳහා උපදේශන සේවා ලබා දීම සිදු කෙරේ. |
| 13 | ජාතික තරුණ මෘදුකාංග තරඟාවලිය | 40.00 | 44.51 | 82.0% | • UNDP සහාය ඇතිව පළාත් 09ක තරඟ පැවැත්වීම සඳහා ප්‍රතිපාදන සපයා ඇත.<br>• සියළුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි Hackadev ව්‍යාපෘතිය පැවැත්විණි.<br>• අනෙකුත් clustered Hackadevs සහ incubator සහායක සේවා මූලිකවම සැලසුම් කර ඇත. |
| 14 | ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික උපාය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 241.88 | 103.20 | 84.0% | • ජාතික ඩිජිටල් ආර්ථික ක්‍රමෝපායයන් නිර්මාණය කිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම.<br>• පරීක්ෂණ වාර්තාව සහ අඩුපාඩු විනිශ්චය වාර්තාව උපදේශක ආයතනය විසින් සම්පූර්ණ කරන ලදී.<br>• ව්‍යාපෘති කළමණාකරන කටයුතු ICTA විසින් සිදු කරමින් පවතී. |
| | **එකතුව** | **1544.23** | **637.96** | | |

# පරිච්ඡේදය - 03

**ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2018.12.31 දින දක්වා ක්‍රියාත්මක කල ව්‍යාපෘති | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
| අනු අං කය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| 1 | ලංකා රාජ්‍ය ජාලය 2.0 (LGN 2.0) | 1013.58 | 303.38 | 97% | •Firewall කළමනාකරණය, වයර් රහිත ජාල කළමනාකරණය, පරිශීලක සහතික කිරීම, Network Management and Monitoring, ඇතුළුව LGN Core සහ සේවා ස්ථාපිත කර ක්‍රියාත්මක වේ.<br><br>1.2018 හතරවැනි කාර්තුව වන විට LGN ස්තාපිත ස්ථාන 860න් 847ක සම්පූර්ණ ස්ථානගත කිරීම් අවසන් කරන ලදී.ඉතිරි ස්ථාන 13 ස්ථානගත කිරීම් 2018 දෙසැම්බර් මාසය වනවිට සම්පූර්ණ කරනු ඇත. ලංකා රජයේ තොරතුරු යටිතල පහසුකම් (Lanka Government Information Infrastructure - LGII) සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන මගින් සේවා විමසුම්,පාරිභෝගිකයන් වෙතින් මතුකෙරන විවිධ වෙනස්වීම් සඳහා කෙරෙන ඉල්ලීම් සහ ඉදිකිරීම් ඇතුළු වෙනත් දෛනික කළමනා කරන කටයුතු සිදුකෙරෙමින් පවතී. සෙසු ස්ථාන 13 තුල සිදුකිරීමට නියමිත ස්ථානගත කිරීම් පිළිබඳව, සේවා සම්පාදක ආයතන (ශ්‍රී ලංකා ටෙලිකොම්) සමග සිදුකෙරෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් සතිපතා සිදුකෙරේ.<br><br>2.2018 දෙසැම්බර් මාසයේ දී ප්‍රවේශ පත්‍ර ලියාපදිංචි කිරීම හා විසඳීම සඳහා ප්‍රවේශ පත්‍ර 440 ක් සහ 2019 දී ලියාපදිංචිවූ සහ විසඳුම් ලබා ගත් ප්‍රවේශ පත්‍ර 330 කි.<br><br>3.ආසන්න වශයෙන් කොළඹ (2), කුරුණෑගල, බදුල්ල, යාපනය, මහනුවර, ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි 1030ක පමණ රාජ්‍ය නිලධාරීන් පිරිසකට දැනුවත් කිරීමේ වැඩසටහන් 7ක් ක්‍රියාත්මක කර තිබේ. |
| 2 | ලංකා රාජ්‍ය වලාව 2.0 (LGC 2.0) | 250.92 | 84.54 | 95% | 1. වැඩිදියුණු කරන ලද වානිජ්‍ය මට්ටමේ ලංකා රාජ්‍ය වලාව 2.0 (LGC 2.0) 2018 අගෝස්තු මාසයේ සිට සථාපිත අතර මේවනවිට සක්‍රියව පවතී. ඊට අමතරව LGN 2.0 සහ LGC 2.0 අතර සම්බන්ධීකරණය කෙරෙන සබැදීන්ද අගෝස්තු මාසයේදී ස්ථාපිත කර තිබේ. Infrastructure as a service (IAAS) සහ platform as a service (PAAS) යන සේවාවන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඒ ඒ රාජ්‍ය ආයතන වෙතින් ඉදිරිපත් කෙරෙන විවිධ ඉල්ලීම් සලකා බලමින් මෙ වනවිට ක්‍රියාත්මක කරමින් පවතී . උදා :- ප්‍රවේශ පත්‍ර පද්ධතිය CCF, ජාතික ගමනාගමන කොමිසම සඳහා ; ක්‍රියාවලිය ස්වයංක්‍රීකරණය.<br><br>2. 2018 ජුනි මාසය වනවිට මධ්‍යගතකරණය කරන ලද ලංකා රාජ්‍ය වලාව ස්ථාපිත කරන ලදී. ආරම්භයේදී උක්ත ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුනේ 2018 ජනවාරි මාසයේදී ය. නමුත් LGN 2.0 සහ LGC 2.0 අතර සැබැදීන් මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී එල්ලවූ නොවැලැක්විය හැකි හේතුන් මත සම්පූර්ණ කිරීමේ දින වකවානු වෙනස් විය .යෙදවුමට අදාළ පහසුකම් සැපයීම LGC 1.0 සිට LGC 2.00 වෙත 2019 දෙසැම්බර් මාසය වනවිට සිදුවනු ඇත.<br><br>3. 2018 අගෝස්තු මාසයේ සිට, රාජ්‍ය ආයතන සඳහා සේවා සැපයුම් සේවා සැපයීම ආරම්භ කරන ලදී. |

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2018.12.31 දින දක්වා ක්‍රියාත්මක කල ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
|---|---|---|---|---|---|
| අනු අංකය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| 03 | සේවක අර්ථසාධක අරමුදල (EPF) සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල (ETF) ඒකාබද්ධ පද්ධතිය | 17.73 | 5.03 | 77% | 1. ව්‍යාපාර ක්‍රියාවලියේ වැඩිදියුණු කිරීම් අධ්‍යන වාර්තාව 100% සම්පූර්ණයි.<br>2. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල core system සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලිය සඳහා උපදේශන සමාගමක් සේවා නියුක්ත කර ගැනීම 100% සම්පූර්ණයි. පළමු බාරදිය යුතු වාර්තාව (Inception report) සම්පූර්ණයි.<br>3. මධ්‍යම මට්ටමේ කළමනාකාරිත්ව සේවකයන් 200ක් සඳහා වූ කළමනාකරණ අංශයන්හි වෙනස්වීම් සහ දැනුවත්කිරීම් වැඩසටහන් (සැසිවාර දෙකක්) 2019 සම්පූර්ණ කිරීමට නියමිතයි.<br>4. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා වූ ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන් 2019 සම්පූර්ණ කිරීමට නියමිතයි. |
| 04 | ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතිය | 18 | - | 79% | • ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියට අදාළව සැපයුම් 5න් 2ක් මේවනවිට බාරදී ඇත. තුන්වන සැපයුමෙන් 80% මේ වන විට සම්පූර්ණ කර ඇත. UAT අවසන් කිරීමට නියමිතය.<br>අවශ්‍ය කරන පහසුකම් සම්පාදනය කිරීමේ අපේක්ෂාවෙන් LGN 2.0 ක්‍රියාත්විතයට යෙදවීම ආරම්භ වනතාක් සිටියි.<br>1. සුභසාධන කළමනාකරණ පද්ධතියේ වැඩ 85% දුරට සම්පූර්ණ කර ඇත.<br>2. දිස්ත්‍රික්ක 25ක අදාළ කාර්යමණ්ඩල සඳහා පුහුණුවීම සම්පාදනය කරන ලදී. සුභසාධන ප්‍රතිලාභීන් යටතට ගැනෙන කුටුම්භයන්හි වර්තමාන දත්ත ඇතුළත් කරමින් ගොඩනංවන පද්ධතියේ වැඩකටයුතු තවමත් ආරම්භ කර නැත.<br>3. SRIS තවමත් ක්‍රියාත්මකවීම ආරම්භකර නැත. එබැවින් ප්‍රතිලාභීන් ලෙස තොරා ගැනෙන්නන්ගේ සුදුසුකම් තහවුරු කිරීමේ ක්‍රමවේදය තවමත් ආරම්භ කර නැත.<br>4. 2018 ජූලි මස වන විට අනුමත කරන ලද, ප්‍රකාශනයට පත් කරන ලද සහ විධිමත් පිටවීමේ ප්‍රොටෝකෝලය අනුමත කර ඇත. |
| 05 | ජාතික ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථාන ව්‍යාපෘතිය | 3 | - | 42% | • ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ ටෙන්ඩර් කැඳවීම් ඔස්සේ උපදේශන සමාගමක් තෝරාගෙන අවසන්. ඉදිරිපත් කලයුතු ලේඛනයන්ගේ වැඩකටයුතු 50% අවසන්. මෙම ව්‍යාපෘතියේ කාර්යයන් ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා SL\|CERT ආයතනය වෙත පවරා ඇත. |

| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2018.12.31 දින දක්වා ක්‍රියාත්මක කල ව්‍යාපෘති | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
| අනු අංකය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| 06 | ලංකා ද්වාරය යටිතල පහසුකම් නඩත්තුව / සම්බන්ධ සේවාවන් හා සංරවක | 6 | 0.08 | 76% | 1) 2018 ඔක්තෝබර් සිට මාස 12න් මාස 3 කාලයක් සඳහා නඩත්තු සහ සහායක සේවා ක්‍රියාත්මක කර ඇත.එමෙන්ම ලංකා රජයේ ගෙවීම් සේවා සහ අන්තර්ජාල ගෙවීම් ප්‍රතිසන්දන මෘදුකාංග සඳහා නඩත්තු සහ සහායක සේවා මාස දෙක පුරා ක්‍රියාත්මක කර ඇත.<br>2) දිවයිනේ සියලුම පළාත්වලට eRL භාවිතාව ලබාදී අවසන් කර ඇත. දැන් eRL භාවිතාව සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් ප්‍රධාන කාර්යාලවල ක්‍රියාත්මක වේ. ඕනෑම පළාතක වෙසෙන ජනතාවට තම ලියාපදිංචි කර ඇති වාහන සඳහා අවශ්‍ය මාර්ග ආදායම් බලපත්‍රයක් ලබා ගත හැකියි. |
| 07 | ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති සහ උපාය මාර්ග හා සම්බන්ධ ක්‍රියාකාරම් පිළිගැනීම, දැනුවත් කිරීම, ප්‍රවර්ධනය සහ අධීක්ෂණය කිරීම | 11.5 | 0.66 | 80% | 1. ඉ-රාජ්‍ය සංකල්ප ප්‍රතිපත්ති (අවසන්) ලේඛනය සම්පූර්ණ කර තිබේ. ඉ -රාජ්‍ය සංකල්ප ප්‍රතිපත්ති (අවසන්)ලේඛනයේ මේ වනවිට ලැබී තිබෙන පුනරීක්ෂණ වාර්තා සළකා බැලීම සඳහා උපදේශාත්මක වැඩමුළු දෙකක් පවත්වා අවසන්. එම ලේඛනයේ සිංහල සහ දමිළ භාෂා පරිවර්තන සම්පූර්ණ කර අවසන්.<br>2. රාජ්‍ය නිලධාරීන් 100 සඳහා උපදේශාත්මක වැඩමුළු පවත්වා අවසන්. (ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ CIO සඳහා වැඩමුළු 100ක් පවත්වන ලදී).<br>3. ලේකම්ගෙන් අවශ්‍ය කරන සුදානම සහ අනුමැතිය ලබාගෙන ඇත. MTDIF මහජන මතය සඳහා පුවත්පත් දැන්වීම් පලකරන ලදී. එමෙන්ම මහජන මතය දැනගැනීම සඳහා බ්ලොග් අඩවියක්ද නිර්මාණය කර අවසන්. අවසාන වශයෙන් තහවුරු කරන ලද ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය සහ ලබාගත් මහජන මතය පුනරීක්ෂණය කිරීම සහ ව්‍යවස්ථාපිත කිරීම අවසන්. ඉ -රාජ්‍ය ප්‍රතිපත්තිය ප්‍රචාරනය සඳහා වන සමාජ මාධ්‍ය ක්‍රියාන්විතය මේ වනවිට සිදුවෙමින් පවතී. |
| 08 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් ලබා දීම. | 20.95 | 7.95 | 71% | • පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාකාරකම් 75% දුරට අවසන්කර ඇත.අමතර අවශ්‍යතා කිහිපයක් මේ වනවිට හඳුනාගෙන ඇත. තවද CR මණ්ඩලයක් පත්කර ඇත. 2019 දී අවශ්‍ය වෙනස්කම් ක්‍රියාවට නැංවුණු පසු UAT සහ OAT මෙහෙයවනු ලබනු ඇත.<br>1. ආරම්භක භාවිතා කරන්නන් 50 දෙනෙකු 2019 වනවිට පුහුණු කෙරෙනු ඇත.<br>2. රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළ ආරම්භක යටිතල පහසුකම් 2017 වනවිට ක්‍රියාත්මක කරන ලදී.<br>3. GAD සේවානියුක්තිකයන් තිදෙනෙකු සඳහා සහතිකපත්‍ර පාඨමාලා ප්‍රධානය 2017 දෙසැම්බර් මාසයේදී සම්පූර්ණ කරන ලදී. |

| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2018.12.31 දින දක්වා ක්‍රියාත්මක කල ව්‍යාපෘති | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
| අනු අං කය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| 09 | ඉ-උරුමය වැඩසටහන - ජාතික උරුමය පිළිබඳ තොරතුරු සඳහා නවීන තාක්ෂණය | 8.06 | 3.63 | 81% | 1. ඉ-උරුමය ශ්‍රී ලංකා ජංගම දුරකථන යෙදවුම සහ වෙබ් අඩවි යෙදුම නිර්මාණය සම්පූර්ණයි. භාවිතයට එක්කල පසු ලෝකයේ ඕනෑම තැනක සිට භාවිතා කල හැක. (2019 පෙබරවාරි මාසයේ නිකුත් කිරීමට අපේක්ෂිතයි).<br>2. අන්තර්ගත නිර්මාණය කිරීම 75% කින් සම්පූර්ණ කර ඇත (text, photographs, audio, and geo locations).<br>3. මේ වනවිට මෙහෙයුම් කමිටු රැස්වීම් 10ක් සම්පූර්ණ කර අවසන් ය. |
| 10 | ජාතික අවකාශයීය දත්ත යටිතල ව්‍යුහය (NSDI) | 90.44 | 17.87 | 87% | 2016 සහ 2017<br>1. NSDI සහ ප්‍රතිපත්ති අධ්‍යයනයේ මූලික සමීක්ෂණය, අවශ්‍යතා අධ්‍යනය සම්පූර්ණයි.<br>2. නෛතික අධ්‍යයනයේ සම්පාදනයන් පහෙන් දෙකක් සම්පූර්ණකර ඇත. තවත් එකක් පරීක්ෂාවනට යොමුකර ඇත.<br>3. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව කාර්යාලයේ ස්කෑන් කරනලද මිනුම් සැලසුම් 74000 ඩිජිටල් කරණය කර අවසන්.<br>4. ශ්‍රී ලංකාවේ ජාතික අවකාශීය දත්ත - පළමු අදියරේ කොන්ත්‍රාත්තුව භාරදෙන ලදී. එය 2018 සැප්තැම්බර් මාසයේදී සම්පූර්ණ කරන ලදී.<br>5. මූලික සමීක්ෂණය සඳහා වැඩමුළු හයක් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිපත්ති අධ්‍යයනය සහ අවශ්‍යතා අධ්‍යනයට අදාළ තවත් වැඩමුළු තුනක් ක්‍රියාත්මක කරන ලදී.<br>6. NSDI ආයතනයට අවශ්‍ය GIS (භූගෝලීය තොරතුරු පද්ධති) දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියට අදාළ පුහුණු වැඩමුළු විස්සක් සම්පූර්ණ කර ඇත.<br>7. රාජ්‍ය නිලධාරීන් උදෙසා අවකාශීය දත්ත කළමනාකරණය පිළිබඳ තෙදින නේවාසික පාඨමාලාවක් සම්පූර්ණ කරන ලදී.<br>8. NSDI පුහුණු සැසි සඳහා අවශ්‍ය ප්‍රචාරණ වීඩියෝපට සහ සම්මන්ත්‍රණ අවශ්‍යතා සම්පූර්ණ කර ඇත.<br>9. NSDI දැනුවත්කිරීමේ වැඩමුළු දෙකක් ක්‍රියාත්මක කර තිබේ. |
| 11 | වෙබ් සංවර්ධන මූලාරම්භය | 2.27 | 1.17 | 93% | 1. දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වෙබ් අඩවි 319ක් නිර්මාණය කර භාවිතයට යොදවා තිබේ. තවත් වෙබ් අඩවි 37ක අන්තර්ගතය ඒ ඒ ආයතන විසින් තහවුරු කරන තෙක් තවමත් නිර්මාණය කරමින් පවතී. අනෙක් ආයතන 24 ක් අතුරින් ආයතන 18ක වෙබ් අඩවි නිර්මාණය කර භාවිතයට යොදවා තිබේ. තවත් වෙබ් අඩවි 6 ක අන්තර්ගතය තහවුරු කරගනිමින්, නිර්මාණය කරමින් තිබේ. සමස්තයක් වශයෙන් වෙබ් අඩවි 337ක් නිර්මාණය කර අවසන් කර ඇත.<br>2. වෙබ් අඩවි අන්තර්ගත කළමනාකරණය පිළිබඳව තොරතුරු තාක්‍ෂන නිලධාරීන් 222 දෙනෙකු වැඩමුළු 8කදී පුහුණුකර අවසන් කර ඇත. |

| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2018.12.31 දින දක්වා ක්‍රියාත්මක කල ව්‍යාපෘති | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
| අනු අංකය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| | | | | | 3. වෙබ් අඩවි අන්තර්ගත කළමනාකරණය පිළිබඳව වෙනත් ආයතන 24ක තොරතුරු තාක්‍ෂන නිලධාරීන් 72 දෙනෙකු පුහුණු කර ඇත. |
| 12 | ඉලෙක්ට්‍රොනික සේවාවන් සංවර්ධනය | 24.36 | 14.40 | 94% | 1. සමස්තයක් වශයෙන් ඉ-රාජ්‍ය සේවාවන් 12 ක් අවසන් කර ඇත (2017 දී ඉ-සේවාව ලබා දීම ආරම්භ කරන ලදී). දැව බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව සඳහා වන දෙපාර්තමේන්තුවට අතිරේක ඊ-සේවාව සංවර්ධනය කෙරේ. සංවර්ධනය වෙමින් පවතී (20%).<br>i. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් බංගලා වෙන්කර ගැනීමේ මාර්ගස්ත සේවාව සහ එහි කළමනාකරණ පද්ධතිය<br>ii. ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා බංගලා වෙන්කර ගැනීම සහ කළමනාකරණ පද්ධතිය<br>iii. ජාතික අයවැය දෙපාර්තමේන්තුව සඳහා අයවැය අධීක්ෂණ පද්ධතිය<br>iv. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය<br>v. ඉ-ටිකට්පත් කළමණාකරණ උරුමයන් සඳහා වූ උරුමය - මධ්‍යම සංස්කෘතික අරමුදල<br>vi. මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා සංචාරක මණ්ඩලයේ ඉ-ටිකට්පත් වෙබ් අඩවිය<br>vii. ටිකට්පත් වෙන් කිරීම උරුම ස්ථාන සඳහා ඉ-සේවාව - මධ්‍යම සංස්කෘතික අරමුදල<br>viii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා හදිසි ආරක්ෂක ජංගම යෙදුමක්<br>ix. උරුම ස්ථාන සඳහා ඉ-ටිකට්පත් ජංගම යෙදුම - මධ්‍යම සංස්කෘතික අරමුදල)<br>x. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් උත්පාදන ආයතන ඒකාබද්ධ කිරීම (සංවිධාන 23)<br>xi. IRD සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට ඉල්ලුම් කිරීම<br>xii. විදුලි සංදේශ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සඳහා මාර්ගගත වීසා අයදුම්පත් නිර්දේශන ක්‍රියාවලිය)<br>xiii. දැව බලපත් නිකුත් කිරීම - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.<br>2. ඉ-සේවාවන් 12 කළමනාකරණය සාර්ථක ලෙස නිම කර ඇත.<br>3. රාජ්‍ය ආයතන සඳහා වඩාත් ඵලදායී ඉ-සේවා සහ ජංගම යෙදවුම් හඳුනා ගැනීම සඳහා රාජ්‍ය නිලධාරීන් 75 දෙනෙකු සඳහා වැඩමුළුව තුනක් සම්පූර්ණ කරන ලදී. |

| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2018.12.31 දින දක්වා ක්‍රියාත්මක කල ව්‍යාපෘති | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | මූල්‍ය තත්වය | | භෞතික තත්වය | |
| අනු අංකය | ව්‍යාපෘති නාමය | 2018 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිදාන/ ප්‍රතිලාභීන් ගණන/ ව්‍යාපෘති ප්‍රගතිය |
| 13 | රාජ්‍ය තොරතුරු මධ්‍යස්ථානය කළමනාකරණය කිරීම හා මෙහෙයවීම (GIC) | 31.7 | 22.67 | 84% | 1. ඇමතුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සහ කළමනාකරණය සහ එය ක්‍රියාත්මක කිරීම අවසන් වී ඇත. දුරකතන ඇමතුම් මධ්‍යස්ථානයක්( Call center) ස්ථාපිත කරන ලද අතර, එම ඇමතුම් කළමනාකරණය සහ හැසිරවීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලදී.<br><br>2. GIC ද්වාරය සහ GIC ජංගම යෙදුම හි සංවර්ධනය සඳහා වන ප්‍රසම්පාදනය ප්‍රදානය කෙරුණු අතර, එහි සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතී.<br><br>3. වෙබ් අඩවි කළමනාකරණය, Chatbot කළමනාකරණය, දැනුම තහවුරු කිරීම සහ යාවත්කාලීන කිරීම පිළිබඳ වැඩමුළු 10ක් විදුලි සංදේශ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව රාජ්‍ය නිලධාරීන් 200ක් සඳහා පවත්වන ලදී.<br><br>4. GIC ඇමතුම් මධ්‍යස්ථානය සඳහා වඩාත් ඉල්ලීම් ඇති ආයතන අතුරින් අතුරින් ආයතන 20කට Chatbot දත්ත සම්පාදනය සම්බන්ධීකරණය කර දෙන ලදී. |
| 14 | රාජ්‍ය සේවකයින් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මානව සම්පත් ධාරිතා සංවර්ධනය | 32.48 | 4.42 | 82% | 1. ඉ-රාජ්‍ය (e-Government), e-Learning වේදිකාව සංවර්ධනය කිරීම සඳහා රජයේ පාර්ශවකරුවන්ගෙන් ප්‍රතිචාර සහ සැලකිලිමත් වීම සඳහා උපදේශන වැඩමුළු 4 ක් පවත්වන ලදී. තොරතුරු දැන ගැනීමේ අයිතිය සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කර ඇති අතර, එය පද්ධතියේ මොඩියුලයක් ලෙස ඇතුලත් කර ඇත. පද්ධතියේ බීටා අනුවාදය ලබා දීමට සූදානම්ය.<br><br>2. CIO නිළධාරීන් 30 දෙනෙකු විසින් PIM ආයතනයේ e-Governance පිළිබඳ පශ්චාත් උපාධි සම්පූර්ණ කරන ලදී. |
